Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පුරප්පාඩු

විවෘත අයදුම්පත් කැඳවීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, වැඩ පරිපාලක (නඩත්තු) තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම සඳහා උපදෙස්

1. අයදුම්පත් **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක්** ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත පෝරමය **gwu.ac.lk** වෙබ් අඩවියේ **vacancies** යටතේ ඉදිරිපත් කර ඇත. **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්,** බාගත කර **(Download) අයදුම්කරු විසින් අත්සන් කොට 2026.11.19** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.

2. අයදුම්කරුවන් විසින් නැවත නොගෙවනු ලබන රු. **750/-** ක අයදුම්පත් හා විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය නමින් මහජන බැංකුව, යක්කල ශාඛාවේ **333-1001-1-0000059** ගිණුම් අංකයට බැර කොට, අදාල රිසිට්පතෙහි මෘදු පිටපත මාර්ගගත ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි PDF ලෙස උඩුගත **(upload)** කළ යුතු වේ. එහි මුල් පිටපත අයදුම්පත සමඟ එවීම අනිවාර්ය වේ.

3. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම (එම ඡායා පිටපත් ග්‍රාම නිලධාරි, සාම විනිසුරු හෝ රජයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර තිබීම අනිවාර්යය වේ), මුදල් ගෙවූ ලදුපත අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

4. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වූ පෝරමය **2026.10.29 දින සිට 2026.11.19 දින දක්වා** විවෘතව පවතිනු ඇත. තාක්ෂණික ගැටළු හෝ විමසීම් වේ නම් 033 2222748 හෝ 033 2215829 දුරකථන අංකවලට (රාජකාරි දිනවල පෙ.ව 9.00 – ප.ව. 4.00) ඇමතිය හැකිය.

5. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපත විද්‍යුත් තැපෑල හරහා එවනු ලබන නිසා අයදුම්කරුවන් තමන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කිරීම අනිවාර්ය වේ. (මාර්ගගත පෝරමයට ප්‍රවේශ වීම සඳහා ලබා දී ඇති විද්‍යුත් තැපෑල ඔබ සමඟ සන්නිවේදනය කිරීමට භාවිතා කරනු ඇත)

gazette.lk

<u>වැඩ පරිපාලක (නඩත්තු) - III ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම්:

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව, අවස්ථා 2 කට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 ක් සමත්වීමෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

2. ශ්‍රමිකයින් අධීක්ෂණය කිරීමේ අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් තිබිය යුතුය.

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් නිශ්චිත සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය
- මනා චරිතයක් තිබිය යුතුය

වැටුප් පරිමාණය : රු. 49,475 - 17 x 540 - 58,655 (මසකට) [U-MN1 (III)]

බඳවා ගැනීමේ ක්‍රමවේදය : යෝග්‍යතා පරීක්ෂණයක් (Aptitude test) සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම.

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරි
2026.10.29

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED